www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලෝක සමාජවාදී වෙබ් අඩවියේ නව සැලසුම ඔක්තෝබර් 22 වන බදාදා දියත් වෙයි

## Redesigned *World Socialist Web Site* begins Wednesday, October 22

**2008 ඔක්තෝබර් 16**

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* නව සැලසුම ඔක්තෝබර් 22 වන බදාදා දියත් කරන බව ජාත්‍යන්තර කර්තෘ මන්ඩලය සතුටින් දැනුම් දී සිටී.

වෙබ් අඩවිය අලුතින් සැලසුම් කිරීම වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ ඒ වෙනුවෙන් වැඩ කල ජාත්‍යන්තර පරිමාන වෙබ් සැලසුම්කරුවන්ගේ හා තාක්ෂනඥයන්ගේ පරිශ්‍රමයක ප්‍රතිඵලයකි. 1998 පෙබරවාරියේ දී එය ආරම්භ කිරීමෙන් පසුව සිදු කර ඇති ප්‍රථම මූලික නව සැලසුම්කරනය වන මෙහි දී, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වෙබ් සැලසුම්කරනයේ හා තාක්ෂනයේ නවතම වර්ධනයන් යොදා ගනු ඇත. එහි අලුත් හා නවීන මුහුනවරට අමතරව, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය*, වඩා වැඩි දියුනු ගූගල්-පාදක සෙවුම් යන්ත්‍රයක් ඇතුලු, ක්‍රියාකාරිත්වයේ සැලකිය යුතු දියුනු විධික්‍රම ඉදිරිපත් කරයි. නව සැලසුමකින් යුක්ත වෙබ් අඩවිය, ප්‍රවෘත්ති හා අදහස් දැක්වීම් ඉදිරිපත් කිරීමේ දී වීඩියෝ තාක්ෂනය ද පුලුල් ලෙස යොදා ගනු ඇත.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* නව සැලසුම්කරනය සිදු කරනු ලැබ ඇත්තේ ශීඝ්‍රයෙන් වැඩෙන පාඨකත්වය විසින් මතු කෙරෙන ඉල්ලීම්වලට ප්‍රතිචාර වසයෙන් සහ දේශපාලන තත්වයේ ප්‍රධාන වෙනස්කම් ද පෙරදකිමිනි. ජාත්‍යන්තර පන්ති අරගලය උත්සන්න වීමකට නොවැලැක්විය හැකි ලෙස ම තුඩු දෙනු ඇති, ගෝලීය ආර්ථික අර්බුදයේ පුපුරනසුලු වර්ධනය, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* නව සැලසුම දියත් කිරීම අතිශයින් ම කාලෝචිත පියවරක් බවට පත් කරයි.

යලිත් ඔබට මතක් කරන්නේ, අලුතින් සැලසුම් කෙරුනු වෙබ් අඩවිය දියත් කෙරෙන්නේ ඔක්තෝබර් 22 දා ය. එය ඔබට මග නොහැරීමට වග බලා ගන්න!

© www.wsws.org